# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

## (2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතින් සංස්ථාපිත)

# කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (තනතුරු 01 යි)

ඉහත සඳහන් තනතුර සඳහා රජයේ / රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / නිත්‍ය ජනාධිපති කොමිෂන් සභා හෝ පරීක්ෂණ කොමිෂන් සභාවල දැනට සේවය කරන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. එහි අයදුම්කරුවන් තම අයදුම්පත අදාල ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුයි.

**සුදුසුකම් :**

(අ) **අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී**

i. සිංහල / දෙමළ
ii. ගණිතය
iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් එකවර සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

(ඇ) සේවයෙහි ස්ථිර පත්වීම දැරිය යුතු අතර, එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED.

(ඈ) නියමිත දිනට ස්ථිර පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටතේ පිරිසෙයින් වසර 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**වයස :** අවු. 18 ට නොඅඩු 45 නොවැඩි

**වැටුප් ක්‍රමය :** MA 1-2 2016 රු. (27,910-10x300-7x350-12x600-12x710-49,080)

**පොදු කොන්දේසි :**

01. තෝරාගනු ලබන අය 1956 අංක 22 රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීති රීති වලට යටත් වේ.
02. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධක අරමුදලට හා සේවක භාර අරමුදලට දායක කරනු ලැබේ.
03. නිත්‍ය ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවල හෝ පරීක්ෂණ කොමිෂන් සභාවල සේවය කරන අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
04. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමිවේ.

මෙහි සඳහන් ආරම්භක වැටුප 2020.01.01 සිට ක්‍රියාත්මක වේ. එතෙක් ගෙවනු ලබන්නේ 02/2016 චක්‍රලේඛය අනුව ගණනය කළ වැටුප් පරිමාණයන්ය.

අයදුම්කරුවන් සිය සහතිකවල ඡායා පිටපත් සමග තමන් විසින් පිළියෙල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2019.09.12 වන දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සටහන් කළ යුතුය.

**සභාපති,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව,**
**බ්ලොක් 2,**
**කාමර අංක 203-204,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,**
**බෞද්ධාලෝක මාවත, කොළඹ 07.**

Source: Dinamina, Daily News (2019.08.29)